# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2373/22 - 2024 පෙබරවාරි මස 27 වැනි අඟහරුවාදා - 2024.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### බලතල පැවරීම

2023 දෙසැම්බර් මස 01 වැනි දිනැති අංක 2360/60 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මගින්, ගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාවට අනුව මා වෙත පවරා ඇති විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන හා ක්‍රියාත්මක කළ යුතු නීති හා අණපනත් අතරින්, පහත උපලේඛනයේ සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන්, ආයතන, ව්‍යාපෘති සහ අණපනත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 (5) ව්‍යවස්ථාව මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 දෙසැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

හරින් ප්‍රනාන්දු (පා. ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2024 ක් වූ පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛන අංක 01**

| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන ව්‍යාපෘති | ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත් |
|---|---|---|
| 1. ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත "ජවසම්පන්න පරපුරක් බිහිකිරීම" සඳහා අදාළ නීති සහ අණපනත් වලට අනුකූලව ක්‍රීඩා හා යෞවන කටයුතු විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය අයෝජන හා ජාතික සංවර්ධන වැඩ පිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය<br><br>ක්‍රීඩා වෛද්‍ය ආයතනය<br>ජාතික ක්‍රීඩා විද්‍යායතනය | ක්‍රීඩාවලට යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2023 අංක 33) |


1A - G 41492 — 09 (2024/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන ව්‍යාපෘති | ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත් |
|---|---|---|
| 2. තාරුණ්‍යයේ ජවය සමාජ විරෝධී අංශ වෙත යොමු වීම වළක්වමින් පාසල් අධ්‍යාපනයේ සිට විෂය බාහිර ක්‍රියාකාරකමක් වශයෙන් ද, යෞවන සමාජ, ක්‍රීඩා සමාජ හරහා ද, ක්‍රීඩා කටයුතු තාරුණ්‍ය වෙත හඳුන්වාදීම සඳහා වැඩපිළිවෙලක් සකස්කිරීම<br>3. අධ්‍යාපනයට අමතරව ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා සඳහා පාසල් දරුවන් ආකර්ෂණය කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න ළමා පරපුරක් සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම<br>4. දිවයින පුරා විසිරී ඇති ග්‍රාමීය පාසල්වල ක්‍රීඩාවට දක්ෂතා දක්වන දරුවන් කුඩා කාලයේ සිටම හඳුනාගෙන ඔවුන්ගේ කුසලතාවයන් ජාත්‍යන්තර මට්ටම දක්වා ගෙන ඒමට අවශ්‍ය නිසි පෝෂණය සහ පුහුණුව ඇතුළු පහසුකම් සපයන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.<br>5. ක්‍රීඩා උපදේශකයන්, පුහුණුකරුවන් සහ භෞති චිකිත්සකයින් වැනි ක්‍රීඩාවේ දියුණුවට අවශ්‍ය සම්පත්දායකයන් බිහිකිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.<br>6. දිවයින පුරා පිහිටි ක්‍රීඩාගාර හා ක්‍රීඩා භූමි පිළිගත් ප්‍රමිතිකරණයට ලක් කොට ඒවා ඊට ගැළපෙන අයුරින් සංවර්ධනය කිරීම.<br>7. ග්‍රාමීය ක්‍රීඩා සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ සහ භාණ්ඩ බෙදා දීම.<br>8. දේශීය සම්ප්‍රදායික ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම. | | |
| 9. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රීඩා අධ්‍යාපනය පුළුල් කිරීම | | |
| 10. ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම. | | |

EOG 02 - 0191

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.